අපි දරුවන් සමග සානිය්යතුල් වදා නමැති ස්ථානයට ගොස් අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාව මුණ ගැසෙන්නෙමු.

අස් සාඉබ් ඉබ්නු යසීද් -රළියල්ලාහු අන්හුමා- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “තබූක් සටනින් නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැමිණි
කල්හි ජනයා එතුමාණන් හමු වූහ. එවිට මම ද දරුවන් සමග සනිය්යතුල් වදා නම් ස්ථානයේ එතුමාණන් හමු වූයෙමි.“ ඉමාම් බුහාරි තුමා විසින් වාර්තා කළ හදීසයේ, “අපි දරුවන් සමග සනිය්යතුල් වදා නමැති ස්ථානයට ගොස් අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි
වසල්ලම්- තුමාව මුණ ගැසෙන්නෙමු.“ [එම හදීසයේ වාර්තාවන් දෙක සමග පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත]

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා තම සගයින් සමග තබූක් සටනින් නැවත හැරී ආ කල්හි ඔවුන් මුණ ගැසෙන්නට මදීනාවට සමීපයෙන් වූ සනිය්යතුල් වදාඃ නම් ස්ථානයට ඔවුහු පිටත්ව ගියහ. එය ඔවුනට ඇති හිතවත්කම පෙන්වීමටත් ඔවුනට අත් වූ අනතුරු සඳහා සිත් සනසන්නටත් යුද්ධයේ නායකත්වය දැරුවන්ට ප්රසාදය පළ කිරීමටත්ය.

http://www.sunnah.global/hadeeth/si/show/6386